# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT 2010




## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
## இலங்கை போக்குவரத்து சபை
## SRI LANKA TRANSPORT BOARD

අංක 200, කිරුළ පාර - නාරාහේන්පිට - කොළඹ 05
இல,200,கிருல வீதி நாரேஹென்பிட்டி, கொழும்பு
No: 200, Kirula Road, Narahenpita, Colombo 05

# වාර්ෂික වාර්තාව

# 2010

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන


1. දැක්ම මෙහෙවර අරමුණ

2. හැඳින්වීම

3. සභාපතිතුමාගේ පණිවිඩය

4. 2010 තුළ කාර්යසාධනය සහ ප්‍රගති සමාලෝචනය

5. අවසාන ගිණුම්

6. විගණකාධිපති වාර්තාව

## දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

## මෙහෙවර

ජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක් මගින් ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

## අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ග වල බස් සේවා යෙදවීම.

4. කොටුව මධ්‍යම බස් නැවතුම් පලේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන්වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් පොකුරු බස් සමාගම්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල් වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වටල වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ මාර්ගස්ථ ගබඩාවෙන් පවත්වාගෙන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම් සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

## හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර, මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනය කරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මොටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවක් පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්ම වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රාදේශීය සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකක වලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, ලං.ගම විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්‍යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටම වැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකිවීම නිසාත් මගින් ප්‍රවාහනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රාජ්‍ය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩල ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් ාඅඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර, ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතු විය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භ කර 1993 වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින්, අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවීය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තයන්, විනය බරපතලසේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථක සේවාවන් වැනි සමාජමය වගකීම්, වෘත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්‍යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂණයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්ණයට විසඳුමක් වශයෙන් " 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගන පනත" මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

## සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2010 වර්ෂයේ කාර්ය සාධනය ගැන සතුටුවිය හැකි මට්ටමක පැවතින. ශ්‍රී ලංගමයේ ඉදිරි ගමනට රුකුලක් මෙන්ම ධෛර්යය ඇති කිරීමක්ද වේ. මගී ජනතාවට විශ්වාසනීය හා ආරක්ෂාකාරී ප්‍රවාහන සේවයක් සලසන අතරම, සමාජීය වශයෙන් විශේෂ ව්‍යාපෘති හැටියට සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය සමාජයේ පැසසුමට ලක්වන අයුරින් ක්‍රියාත්මක කිරීමට ලැබීමද විශේෂත්වයකි.

පසුගිය වසර 4ක පමණ කාලය දෙස ආපසු හැරී බලන විට දිනකට ධාවනය කරන කිලෝ මීටර් ප්‍රමාණය ලක්ෂයකින් පමණ වැඩිවීම යහපත් වර්ධනයක් බව කිව යුතුය. 2007 වර්ෂයේදී 835,313 ක් වූ දිනක ධාවන කිලෝ මීටර් 2010 වර්ෂයේදී 935,940 දක්වා වැඩිවී ඇත. මෙම වැඩිවීම මගී ජනතාවට හොඳ ප්‍රවාහන සේවාවක් සැලසූ බවට සහතිකයකි.

මාර්ගලේඛණ ආදායමද වැඩිවූ කිලෝ මීටර් ප්‍රමාණයට සමගාමීව වැඩිවීම ආයතනයේ පැවැත්මට පිටුවහලක් වූ බව කිව යුතුය. 2007 වර්ෂයේදී සාමාන්‍ය දිනක ආදායම මිලියන 29.3 ක් වූ අතර, 2010 වර්ෂයේදී මිලියන 40.2 දක්වා වැඩිවී ඇත. ඒ අනුව මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන විශාල ප්‍රමාණයකින් අඩුවී තිබියදී ද ආයතනය යහපත් අයුරින් පවත්වාගෙන යාමට ලැබීමද වාසනාවකි.

දෛනික ධාවන විස්තර අන්තර්ජාලය හරහා ලබාගැනීමට කටයුතු කිරීම මගීන්ගේ පැමිණිලි වලට ඒ අවස්ථාවේදීම විසඳුම් ලබාදෙන මෙහෙයුම් මැදිරියක් ආරම්භ කිරීම, GPRS තාක්‍ෂණය සමන්විත ඉලෙක්ට්‍රොනික් බස් ටිකට් යන්ත්‍ර සේවයේ යෙදවීම වැනි වැඩසටහන් තුලින් ශ්‍රී ලංගමයට නව ජීවයක් ලබා දීමට හැකිවී ඇත.

තාක්‍ෂණය සමන්විත බස් ටිකට් යන්ත්‍ර මගින් බස් රථය ගමන්ගන්නා ස්ථානය, ආදායම් තත්වය, කිලෝ මීටර් ප්‍රමාණය ආදී තොරතුරු නිරීක්‍ෂණය කිරීමට හැකිවීමට අමතරව, ජංගම පරීක්‍ෂණ අංශය හා විශේෂ විමර්ෂණ ඒකකය අධ්‍යක්‍ෂ මහතකු යටතේ ප්‍රතිසංවිධානය කිරීම, කුලී බඳු ක්‍රමය යටතේ බස්රථ 100 ක් ලබාගැනීමට කටයුතු කිරීම, වැනි සඵල කරගත් කාරණා 2010 වර්ෂයේදී ලද ජයග්‍රහණය හැටියට සැලකිය හැක.

මූල්‍ය අපහසුතා නිසා දීර්ඝ කාලයක පටන් ගෙවීමට හිඟව තිබූ සේවක පාරිතෝෂික දීමනා 2008.12.31 දින දක්වා ගෙවා අවසන් කිරීමෙන් අසහනයෙන් සිටි විශ්‍රාමිකයන්ට යම් ප්‍රමාණයකට සහනයක් වීමද, විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැක.

මේ සියළු කාරණා හොඳින් අවසන් කිරීමටත්, ශ්‍රී ලංගමය තුල යහපත් පරිසරයක් නිර්මාණය කිරීමටත් ලැබීම විශේෂයෙන්ම සඳහන් කල යුතු අතර, ඒ සඳහා සියළුම නිලධාරීන්ගෙන් හා සේවක මහත්ම මහත්මීන්ගෙන් ලැබුණු සහායෝගයද ඉතා අගනේ බව මතක් කර සිටිමි.

ශෂී වෙල්ගම<br>
සභාපති,<br>
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

## සැලසුම් හා සංවර්ධන අංශය

2010 වර්ෂය සඳහා සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම ත්‍රෛයි මාසික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සියළුම ප්‍රාදේශීය වැඩපලවල, රියදුරු පුහුණු පාසැල් වල, සංචාරක බංගලා, ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය, ඕරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ලාභාලාභ වාර්තා ප්‍රධාන කාර්යාලයට ගෙන්වා පරිගණක ගත කිරීම අන්තර්ජාලය හරහා ප්‍රධාන කාර්යාලයට ලැබෙන ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල වල ලාභාලාභ වාර්තා ඒකාබද්ධ කොට ලාභාලාභ වාර්තා පිළියෙල කිරීම. ඒ පිළිබඳව විශ්ලේෂණ වාර්තා අවශ්‍ය පරිදි ඉහල කළමණාකරණයට ඉදිරිපත් කිරීම. තෛයි මාසික බැරකම් වාර්තා වාර ප්‍රවේශ පත්‍ර ප්‍රතිදාන ලබා ගැනීමට අවශ්‍ය කරන වාර්තා පිළියෙල කිරීම. ප්‍රවාහන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව හා අයවැය කාරක සභාවට අවශ්‍ය කරන වාර්තා පිළියෙල කිරීම මෙම කාර්යාලයේ සිදු කෙරේ.

## අභ්‍යන්තර විගණන අංශය

2010 වර්ෂයේ නිකුත් කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව 1532 කි. ඒ තුලින් අයවීමට ඇති මුදල රු. 16,385,385.70 කි.

## ලේකම් කොට්ඨාශය

2010 වර්ෂය තුල සිටින ලද අධ්‍යක්‍ෂක මණ්ඩල සාමාජික මහතුන්ගේ නම් සහ තනතුරු.

| නම | තනතුර |
|---|---|
| 1. ධම්මික හේවාපතිරණ මහතා | සභාපති - ශ්‍රී ලංගම |
| 2. ඩී. විදානගමාච්චි මහතා | භාණ්ඩාගාර/ නියෝජිත |
| 3. එස්.පී.සී. හේරත් මහතා | ලේකම් - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 4. ඩී.එල්. ධර්මප්‍රිය මහතා | ජ්‍යොෂ්ඨ සහකාර ලේකම් - ප්‍රවාහන අමාත්‍යාංශය |
| 5. ආචාර්ය එස්.පී.ඩබ්. ජයසිරිවර්ධන මහතා | අධ්‍යක්‍ෂ - ශ්‍රී ලංගම |
| 6. කේ.එන්. ඉන්ද්‍රතිස්ස මහතා | නීතිඥ |
| 7. කර්නල් පී. රත්නායක මහතා | අධ්‍යක්‍ෂ |

12 වන රැස්වීම - (2009) - 2010 ජනවාරි 12

01 වන රැස්වීම - 2010 මාර්තු 16

02 වන රැස්වීම - (විශේෂ) 2010 අප්‍රේල් 01

03 වන රැස්වීම - 2010 ජුලි 02

04 වන රැස්වීම - 2010 අගොස්තු 13

05 වන රැස්වීම - 2010 ඔක්තොම්බර් 01

06 වන රැස්වීම - 2010 නොවැම්බර් 30

03 වන රැස්වීමේ සිට

1. එම්.ඩී. බන්දුසේන මහතා සභාපති - ශ්‍රී ලංගම
2. එල්.ඒ. විමලරත්න මහතා උප සභාපති/ සාමාජික (ශ්‍රී ලංගම)
3. එම්.එම්.එස්.එස්.බී. යාලේගම මහතා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන අමාත්‍යාංශය)
4. වෛද්‍ය නිහාල් ජයතිලක මහතා ලේකම් - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. අජිත් අබේසේකර මහතා භාණ්ඩාගාර නියෝජිත
6. චන්ද්‍රභානු අධිකාරම් මහතා සාමාජික
7. කේ. ප්‍රසන්න කුමාරසිරි ද සිල්වා මහතා සාමාජික

.

## ටෙන්ඩර් මණ්ඩලය

2010 වර්ෂයේ මහ පරිමාණ ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද මිලදී ගැනීම් වල මුළු වටිනාකම.

| මහ පරිමාණ ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් අංකය | දිනය | මුදල | වෙනත් |
|---|---|---|---|
| 01 | 2010.01.13 | මූල්‍යමය වටිනාකමක් නැත. | - |
| 02 | 2010.02.16 | මූල්‍යමය වටිනාකමක් නැත. | - |
| 03 | 2010.08.11 | 42,254,625.00 | - |
| 04 | 2010.08.11 | 49,119,900.00 | - |
| 05 | 2010.07.30 | මූල්‍යමය වටිනාකමක් නැත. | - |
| 06 | 2010.08.11 | මූල්‍යමය වටිනාකමක් නැත. | - |
| 08 | 2010.11.25 | මූල්‍යමය වටිනාකමක් නැත. | - |

2010 වර්ෂයේ සුළු පරිමාන ටෙන්ඩර් මණ්ඩලය මගින් අනුමත කරන ලද මිලදී ගැනීම් වල මුළු වටිනාකම පහත දැක්වේ.

| මහ පරිමාණ ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් අංකය | දිනය | මුදල | වෙනත් |
|---|---|---|---|
| 01 | 2010.01.12 | 1,450,806.00 | - |
| 02 | 2010.02.26 | 3,755,354.00 | - |
| 03 | 2010.02.26 | 3,827,957.84 | - |
| 04 | 2010.03.18 | 4,707,552.48 | - |
| 05 | 2010.03.18 | 2,661,696.24 | - |
| 06 | 2010.03.18 | 3,061,020.00 | - |
| 07 | 2010.06.16 | 633,047.70 | - |
| 08 | 2010.06.16 | 320,000.00 | මාසික කුලිය රු. 40,000 * 8 |
| 09 | 2010.06.16 | 4,808,860.00 | |
| 10 | 2010.06.16 | 4,998,760.00 | |
| 11 | 2010.09.10 | බස්රථ අපහරණය කිරීම | |
| 12 | 2010.09.13 | 2,478,659.42 | |
| 13 | 2010.09.13 | 4,973,800.00 | |
| 14 | 2010.10.05 | 4,920,370.00 | |
| 15 | 2010.05.09 | 4,580,777.82 | |
| 16 | 2010.10.08 | 4,204,113.95 | |
| 17 | 2010.10.12 | 1,711,963.00 | |
| 18 | 2010.10.11 | 2,300,000.00 | |
| 19 | 2010.10.12 | 173,978.51 | |
| 20 | 2010.10.19 | 2,367,302.73 | |
| 21 | 2010.10.18 | 4,680,775.00 | |
| 22 | 2010.11.19 | 312,250.00 | |
| 23 | 2010.12.10 | බස් ටිකට් මැෂින් සම්බන්ධයෙන් | |
| 24 | 2010.11.30 | 4,661,978.94 | |
| 25 | 2010.12.13 | 3,205,039.10 | |

| | | | |
|---|---|---|---|
| 26 | 2010.12.13 | 4,991,519.50 | |
| 27 | 2010.12.07 | මෝටර් රථ අමතර කොටස් මිල ගණන් අනුමත කිරීම | |
| 28 | 2010.12.29 | 1,741,259.70 | |
| 29 | 2010.12.29 | 1,800,000.00 | |
| 30 | 2010.12.29 | 1,158,528.00 | |
| 31 | 2010.12.29 | 3,772,117.80 | |
| | | 84,259,487.73 | |

**ආරක්ෂක අංශය**

- ශ්‍රී ලංගම අයත් ප්‍රාදේශීය කාර්යාලයන්, ඩිපෝවන්, උප ඩිපෝවන්, ප්‍රාදේශීය වැඩපලවල් හා රියදුරු අභ්‍යාස විද්‍යාල යන සියළුම සේවා ස්ථානයන්ට අයත්ව ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි හා මගී ජනතාව මගින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශණයන් සිදු කිරීම.

- ගිනි නිවීම් කටයුතු සිදු කිරීම.

- 2010 වර්ෂය තුල කරන ලද විමර්ශන ප්‍රමාණය 250 ක් පමණය.

- ශ්‍රී ලංගම අයත් නඩු ඇපකරයන් වලට මුදල් බැඳීමේදී හා ප්‍රධාන කාර්යාලය සතුව කෙරෙන මූල්‍ය කටයුතු සඳහා දෛනික වශයෙන් ආරක්ෂාව ලබාදීම.


- ශ්‍රී ලංගමයට අයත් ආයතනයන්හි වැදගත් ස්ථාන හා ප්‍රභූ ආරක්ෂාව සැපයීම, රථවාහන නැවැත්වීම, පාලනය කිරීම, අදාල ආයතනයන් වෙත කරණු ලබන සියලුම සැපයීම් හා නිකුත් කිරීම් අධීක්ෂණය කිරීම.

- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඇතුලු සියලුම සේවා ස්ථානයන් වල සේවක මහත්ම/ මහත්මීන්ට සෘජුව නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම.

**වාණිජ හා සම්පාදක කොට්ඨාශය**

මධ්‍යම ගබඩාව (කටුබැද්ද) සහ ප්‍රධාන ගබඩාව (නාරාහේන්පිට) ගබඩා කොටස් දෙකෙන්ම නිකුත් කල අමතර කොටස්, ලිපි ද්‍රව්‍ය, කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ, ටයර් සහ බැටරි වල වටිනාකම පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| අමතර කොටස්, ටයර්, බැටරි, යන්ත්‍රෝපකරණ, අයුධ වල වටිනාකම | රු. | 584,432,658.28 |
| ලිපි ද්‍රව්‍ය, ගෘහ භාණ්ඩ සහ අනෙකුත් කාර්යාලීය අවශ්‍යතාවයන් සඳහා | රු. | 55,636,835.47 |




## ධාවන කොට්ඨාශය

1. <u>දෛනික ධාවන විස්තර අන්තර්ජාලය හරහා ලබාගැනීම ක්‍රියාත්මක කිරීම</u>
   ඩිපෝවල බස් ධාවන තත්වය හා ආදායම් ඇතුළු දෛනික තොරතුරු ෆැක්ස් පණිවුඩ මගින් ලබාගැනීම දීර්ඝ කාලයක් තිස්සේ පැවතුන අතර, එය නිවැරදිව හා කඩිනමින් ලබා ගැනීමටත්, ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ සියළුම උසස් නිලධාරීන්ට ඕනෑම අවස්ථාවක දැක බලා ගැනීමටත් හැකිවන පරිදි අන්තර්ජාලය හරහා තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් තොරතුරු හා තාක්ෂණ කළමණාකාර සමඟ සම්බන්ධ වී ඇති කර තිබීම.

2. <u>මෙහෙයුම් මැදිරියක් ආරම්භ කිරීම</u>
   මගීන්ගේ එදිනෙදා ගැටළු සම්බන්ධයෙන් ඍජුව කතාකර විසඳාගත හැකි වන පරිදි පැමිණිලිකරු හා අදාල ඩිපෝව හෝ නිලධාරියා සමඟ එකම අවස්ථාවේ සම්බන්ධ සාකච්ඡාමය මාර්ගයෙන් ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් මැදිරියක් ආරම්භ කිරීම.

3. <u>GPRS ටිකට් යන්ත්‍ර සේවයට යෙදවීම</u>
   අධික මගී තදබදයක් ඇති මාර්ග වල ටිකට් නිකුත් කිරීමට තිබූ අවහිරතාවයට පිළිතුරක් හැටියට හා බස් රථය සිටිනා ස්ථානය දැන ගැනීම, උපදෙස් යැවීම, සොරකම් කිරීමට ඉඩ ඇහිරීම, අවශ්‍ය තොරතුරු නිවැරදිව කඩිනමින් ලබා ගැනීමේ බලාපොරොත්තුව ඇතිව නව ටිකට් යන්ත්‍ර සේවයේ යෙදවීම ආරම්භ කර ඇත. දැනට උඩහමුල්ල ඩිපෝව සඳහා සම්පූර්ණයෙන්ම ටිකට් යන්ත්‍ර යොදවා ඇති අතර, යටිනුවර හා කුරුණෑගල දකුණ ඩිපෝ වල ද ක්‍රියාත්මක වෙමින් පවතී.

4. <u>ජංගම පරීක්ෂණ අංශය ප්‍රතිසංවිධානය කිරීම</u>
   මාර්ගලේඛණ ආදායම වැඩිකර ගැනීම හා රියදුරු, කොන්දොස්තර මහතුන්ගේ විනය උසස් කිරීම සඳහා ජංගම පරීක්ෂණ අංශය ප්‍රතිසංවිධානය කර, මණ්ඩලීය අධ්‍යක්ෂ වරයෙකු යටතට පත්කර ඇත. ඒ අනුව අධ්‍යක්ෂ (විමර්ශන) යටතේ මෙම අංශය දියුණු වීමත් සමඟ ආදායමේ හා සේවකයින්ගේ විනයේ ප්‍රගතියක් දක්නට ඇත.

5. <u>තොරතුරු තාක්ෂණය උපයොගී කර ගනිමින් නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම</u>

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ට අමතරව ත්‍රිවිධ හමුදාව, පොලීසිය, පාර්ලිමේන්තු නිලධාරීන්ට හා අනිකුත් හිමිකම් සඳහා ගමන් බලපත්‍ර නිකුත් කිරීම, තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින් සිදු කිරීම ආරම්භ කිරීම.


6. <u>කුලී බදු ක්‍රමය යටතේ බස්රථ ලබා ගැනීම</u>

ශ්‍රී ලංගමයට නව බස්රථ ලබාදීම රජයෙන්ම සිදු කිරීම මෙතෙක් පැවති ප්‍රතිපත්තිය වූ අතර, එය වෙනස් කරමින් ලංගමය විසින් උපයාගෙන ගෙවා ගත හැකි බව තහවුරු කරමින් කල්බදු ක්‍රමය යටතේ බස්රථ 100 ක් ධාවනයට එක් කිරීම. මෙම වැඩසහටන 2010 වර්ෂයේදී ක්‍රියාත්මක වූ අතර, යම් යම් ප්‍රමාද හේතු කොටගෙන බස්රථ ලැබීම 2011 ජනවාරි දක්වා ප්‍රමාද විය.

7. <u>ධාවන ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය</u>


දිනකට ධාවනය කල කිලෝ මීටර ප්‍රමාණය වර්ධනය කර ගැනීම

| | |
|---|---|
| 2007 වර්ෂයේ දිනකට ධාවනය කල ප්‍රමාණය | 835,313 |
| 2008 වර්ෂයේ දිනකට ධාවනය කල ප්‍රමාණය | 857,033 |
| 2009 වර්ෂයේ දිනකට ධාවනය කල ප්‍රමාණය | 920,168 |
| 2010 වර්ෂයේ දිනකට ධාවනය කල ප්‍රමාණය | 935,940 |





දිනකදි ලබාගත් මාර්ග ලේඛණ ආදායම වර්ධනය කර ගැනීම

| | |
|---|---|
| 2007 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. මිලියන | 29.300 |
| 2008 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. මිලියන | 35.446 |
| 2009 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. මිලියන | 36.829 |
| 2010 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. මිලියන | 40.156 |




සාමාන්‍යයෙන් දිනකදි ලබාගත් වාර ප්‍රවේශපත්‍ර ආදායම වර්ධනය කර ගැනීම

| | |
|---|---|
| 2007 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. | 984,430 |
| 2008 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. | 1,443,219 |
| 2009 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. | 1,469,222 |
| 2010 වර්ෂයේ දිනකට ලබාගත් ආදායම රු. | 1,485,046 |




**ප්‍රජා ව්‍යාපෘති**


ශ්‍රී ලංගම හා ජාතික ගමනාගමන කොමිෂන් සභාව ගිවිසුම්ගතව සිසු සැරිය, නිසි සැරිය හා ගැමි සැරිය ව්‍යාපෘතීන් යටතේ 2010 වසරට අදාලව ශ්‍රී ලංගම මගින් ධාවනය කරන ලද සේවාවන් හා සම්බන්ධ තොරතුරු මෙසේය.

| ව්‍යාපෘතිය | සේවා ගණන |
|---|---|
| සිසු සැරිය | 540 |
| ගැමි සැරිය | 240 |
| නිසි සැරිය | 40 |

**සිසු සැරිය**

2010 වසර තුල ශ්‍රී ලංගම ධාවනය කරන ලද සිසු සැරිය මුල සේවා සංඛ්‍යාව 540 කි. ප්‍රාදේශික අනුව එහි දායකත්වය මෙසේය.

| ප්‍රාදේශිකය | සේවා ගණන |
|---|---|
| කොළඹ | 78 |
| ගම්පහ | 58 |
| කළුතර | 32 |
| මහනුවර | 28 |
| නුවරඑළිය | 4 |
| නැගෙනහිර | 30 |
| රජරට | 58 |
| රුහුණ | 60 |
| සබරගමුව | 97 |
| ඌව | 58 |
| වයඹ | 37 |
| එකතුව | 540 |



**ගැමි සැරිය**


ශ්‍රී ලංගම හා ජාතික ගමනාගමන කොමිෂන් සභාව ගිවිසුම්ගතව ග්‍රාමීය මාර්ගයන්හි ගැමි සැරිය ව්‍යාපෘතිය යටතේ 2010 වසර තුල සේවාවන් 240ක් පවත්වාගෙන යන ලදී. එහෙත් අදාල බස්රත ධාවනයට අදාලව ගැමි සැරිය මූල්‍ය ප්‍රතිපාදන ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ලබාදී ඇත්තේ 2010 ජනවාරි සිට ජුනි දක්වා පමණි. ශ්‍රී ලංගම ප්‍රාදේශිකයන් අනුව එම සේවාවන් මෙසේය.

| **ප්‍රාදේශිකය** | **සේවා ගණන** |
|---|---|
| කොළඹ | 11 |
| ගම්පහ | 38 |
| කළුතර | 19 |
| නැගෙනහිර | 25 |
| රුහුණ | 33 |
| සබරගමුව | 05 |
| ඌව | 40 |
| වයඹ | 69 |
| එකතුව | 240 |

## කාර්මික අංශය

ප්‍රාදේශීය වැඩපල මගින් සිදු කල නිෂ්පාදන වටිනාකම

| <u>වර්ගය</u> | <u>ඒකකය</u> | <u>වටිනාකම (රු)</u> |
|---|---|---|
| එන්ජින් | 322 | 53,191,044.00 |
| ගියර් කට්ටල | 193 | 14,664,121.00 |
| ඇක්සල් | 9 | 473,582.00 |
| බස්රථ වල බඳ අළුත්වැඩියාව | 108 | 20,577,809.00 |
| පොම්ප අළුත්වැඩියාව | 187 | 1,774,101.00 |
| ඉන්ජෙක්ටර් | 774 | 826,873.00 |
| ටයර් | 2590 | 15,353,166.00 |




**ජංගම පරීක්ෂණ අංශය**

මණ්ඩලයේ මාර්ග ලේඛණ ආදායම අවම වශයෙන් 25% ක ප්‍රමාණයක් සොරකම් කෙරෙන බව ගණන් බලා ඇත. එම නිසා විශේෂ පරීක්ෂණ කණ්ඩායම් යොදා ඇති අතර, පහත දැක්වෙන සංඛ්‍යා ලේඛණ මගින් අහිමි වන ආදායම දක්වා ඇත.

| වර්ෂය | බරපතල | සුළු පරිමාන වංචා | ප්‍රවේශ පත්‍ර නොගෙන ගමන් කල මගීන්ගෙන් අයකර ඇති මුදල |
|---|---|---|---|
| 2010 | 1156 | 5162 | රු. 1,670,893.00 |

**පුහුණු අංශය**

2010 වසර තුල පහත දැක්වෙන සේවක කණ්ඩායම් වෙත අප අංශය විසින් පුහුණු වැඩමුළු පවත්වා ඇත.

- රාත්‍රී කායීභාර නිලධාරීන් හා ආරක්ෂක පරීක්ෂකවරුන් සඳහා පුහුණුව.
- උපාධිධාරී පරිවාසක නිලධාරීන් සඳහා වැඩමුළුව.
- පරිපාලන නිලධාරීන්
- හදිසි අනතුරු නිලධාරීන්
- පොත්තැබුම්කරුවන් සඳහා
- ප්‍රධාන කාර්යාලයේ සේවක මහත්ම මහත්මීන්
- ප්‍රාදේශික වල විභාග නිලධාරීන්

- ඩිපෝ වල විමර්ශන නිලධාරීන්
- රථ පාලන හා කාල සටහන් සකසන නිලධාරීන්
- ඵලදායිතා පුහුණු සැසි පැවැත්වීම
- සියලුම ප්‍රාදේශික වල ඉංජිනේරු මහතුන්
- සහකාර කළමණාකාර (මුදල්) නිලධාරීන්
- ගබඩා පාලකවරුන්
- ආරක්‍ෂක නිලධාරීන්
- රියදුරු සහ කොන්දොස්තරවරුන්
- සහකාර ධාවන කළමණාකාර මහතුන්
- කාර්‍ය වක්‍ර විෂය ලිපිකරු
- ඩිපෝ කළමණාකාර මහතුන්

**තොරතොරතුරු තාක්‍ෂණ අංශය**

1. ලාභාලාභ වාර්තාවට අදාල තොරතුරු පද්ධතියේ නව සංශෝධන සිදු කිරීම. (මුදල් කොට්ඨාශය)

2. තොරතුරු තාක්‍ෂණ කොට්ඨාශය සඳහා ( Inventory Control System) තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම. (තොරතුරු තාක්‍ෂණ කොට්ඨාශය)

3. මානවසම්පත් තොරතුරු පද්ධතියේ නව සංශෝධන සිදු කිරීම. (මානව සම්පත් කළමණාකරණය)

4. ශ්‍රී ලංගම සියළුම ප්‍රාදේශිකයන් හි සහයක ගණකාධිකාරීවරුන් සඳහා ලාභාලාභ පිළියෙල පුහුණු වැඩසටහන ක්‍රියාත්ම කිරීම. (ශ්‍රී ලංගම)

5. මෙහෙයුම් කොට්ඨාශය සඳහා Ran Out ව්‍යාපෘතිය නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම. (ශ්‍රී ලංගම)

6. Rout Plan ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. (ශ්‍රී ලංගම)

7. SLTB Bus Renovation තොරතුරු පද්ධතිය සැකසීම. (ශ්‍රී ලංගම)

8. Run Out පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම. (ශ්‍රී ලංගම)

9. Rout Plan පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම. (ශ්‍රී ලංගම)

10. ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරීන් (Regional Coordinator) සඳහා මාස 06ක පරිගණක පුහුණුවක් ලබාදීම. (ශ්‍රී ලංගම)

11. ICS (Inventory Control System) දිවයින පුරා ඩිපෝවන් සඳහා ක්‍රියාත්මක කිරීම. (ශ්‍රී ලංගම)

12. සභාපති කාර්යාලය සහ සභාපති පරිපාලන (AO)කාර්යාලය සම්බන්ධ කරමින් කුඩා පරිගණක ජාලයක් සැකසීම. (සභාපති කාර්යාලය)

13. අභ්‍යන්තර විගණන අංශය පරිගණක ජාල පද්ධතියට සම්බන්ධ කිරීම. Laptop භාවිතා කරන්නන් සඳහා WiFi කලාපයක් කිරීම. (අභ්‍යන්තර විගණන අංශය)

14. සැපයුම් කොට්ඨාශය සහ ප්‍රධාන කාර්යාලය ගබඩා පද්ධති සම්බන්ධ කරමින් LAN එකක් සැකසීම. (සැපයුම් කොට්ඨාශය)

15. ප්‍රධාන කාර්යාලය තුල නව ස්ථාවර දුරකතන 168 සම්බන්ධ කරමින් දුරකථන හුවමාරු කිරීමේ පද්ධතියක් (PABX) ස්ථාපිත කිරීම හා තාක්ෂණික කටයුතු සිදු කිරීම. (ප්‍රධාන කාර්යාලය)

16. ආයතනය මගින් ස්ථාපිත කල (Call Monitoring) මෘදුකාංගය මගින් සියළු ස්ථාවර දුරකතන හි විස්තර වාර්තා ලබා ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

17. ඩයලොග් ආයතන හරහා ස්ථාපිත කරන Wide Area Network එකෙහි ප්‍රධාන Router Install කිරීම සඳහා සියළු තාක්ෂණික කටයුතු සිදු කිරීම.

18. ප්‍රාදේශීය කාර්යාල (II) VPN එක හා සම්බන්ධ කිරීම සහ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය VPN එක හා සම්බන්ධ කිරීම අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම. (ශ්‍රී ලංගම සඳහා)

19. කොළඹ, ගම්පහ, කළුතර, දකුණු ප්‍රාදේශිකයට අයත් ඩිපෝ සියල්ල හා යාපනය ප්‍රාදේශිකයට අයත් ඩිපෝ බොහෝ ප්‍රමාණයක් VPN එක හා සම්බන්ධ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම. (Voice Data) (ශ්‍රී ලංගම සඳහා)

20. ශ්‍රී ලංගම (SLTB) e-mail address සැකසීම සහ කොට්ඨාශ ප්‍රධානීන් හා අවශ්‍ය පුද්ගලයන් ලබාදීම. (ශ්‍රී ලංගම සඳහා)

21. ප්‍රධාන කාර්යාලයේ ඉහල කළමණාකාරිත්වයට හා ප්‍රාදේශීය කළමණාකරුවන්ට Video Phone ලබා දීම සහ එම දුරකථන පරික්ෂා කිරීම, තාක්ෂණික කටයුතු සිදු කිරීම.

22. දුරකථන මධ්‍යස්ථානය සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම හා IP Phone සම්බන්ධ කිරීම. (ප්‍රධාන කාර්යාලය සඳහා)

23. ප්‍රධාන කාර්යාලයේ දුරකථන මධ්‍යස්ථානයේ සිට CBS එක නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය CCTV පද්ධතිය ස්ථාපිත කිරීම.


24. මූල්‍ය කොට්ඨාශයේ දෙවැනි පරිගණක කාමරය සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම. (මූල්‍ය කොට්ඨාශය සඳහා)

25. “එළදායී පියස” පරිගණක ජාල ගත කිරීම. ( ප්‍රධාන කාර්යාලය සඳහා)

**මානව සම්පත් කොට්ඨාශය**


ප්‍රධාන වශයෙන් මානව සම්පත 2010 වසරට අදාලව බෙදී ඇති ආකාරය මෙසේය.

| | |
|---|---|
| රියදුරු | 8,972 |
| කොන්දොස්තර | 8,583 |
| කාර්මික | 5,452 |
| අනෙකුත් සියළුම සේවක | 11,765 |
| එකතුව | 34,772 |





අනෙකුත් සියළුම සේවකයින්ගේ සංයුතිය

| | |
|---|---|
| විධායක (පිරිමි) | 1,048 |
| විධායක (ගැහැණු) | 260 |
| ලිපිකරු හා ඒ හා සමාන | 10,457 |
| එකතුව | 11,765 |





විධාක හා අනෙකුත් සියළුම සේවකයින්ගේ සංයුතිය

| | |
|---|---|
| විධායක | 1,308 |
| අනෙකුත් සියළුම | 33,464 |
| එකතුව | 34,772 |




ස්ථිර සේවකයන් සහ වෙනත්

| | |
|---|---|
| ස්ථිර සේවකයන් | 32,284 |
| අනියම්/කොන්ත්‍රාත්/සේවය දීර්ඝ කිරීම්/පුහුණු | 2,488 |
| එකතුව | 34,772 |




**මාධ්‍ය අංශය**

- "ශ්‍රී ලංගම පුවත්" පුවත්පත හතර වැනි කලාපය ජනවාරි මාසයේත් පස්වැනි කලාපය ජුනි මාසයේත් මුද්‍රණය කිරීම.

- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ විකාශය කෙරෙන හඳ මාමා වැඩසටහන "හඳ මාමා ලංගම චාරිකා" නමින් ඩිපෝවන්හි සේවයේ නියුතු සේවක සේවිකාවන්ගේ දරුවන්ගේ සහභාගීත්වයෙන් 2010 ජනවාරි මාසය දක්වා පවත්වාගෙන යාම.

- ශ්‍රී ලංගම සේවක සේවිකාවන්ට උසස් සිනමා රසවින්දනයක් දීමේ අරමුණින් ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ දෙවන වරට 2010 පෙබරවාරි මස 18 වැනි දින දිවා ආහාර පැයේදී ඉරාන ජාතික සිනමාකරුවකු වූ "මජීඩ් මජීඩ්" ගේ සිනමා පටයක් වන නැරඹීමට සැලැස්වීම.

- ශ්‍රී ලංගම පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතියට දායක වීම.

- ශ්‍රී ලංගම විශේෂ උත්සව අවස්ථා සඳහා මාධ්‍ය ආවරණ සැපයීම හා විශේෂ ප්‍රවෘත්තීන් ජනමාධ්‍ය වෙත ලබාදීම හා එම ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට දායක වීම.

- දිනපතා පුවත්පත් වල පළවන ශ්‍රී ලංගම සම්බන්ධ පුවත් සංරක්ෂණය කිරීම කරන අතරම විශේෂයෙන් ප්‍රධානීන්ගේ අවධානයට ලක්විය යුතු පුවත් අදාල අංශ වෙත යොමු කිරීම.

## ගිණුම් ප්‍රතිපත්ති

1. ශ්‍රී ලංකා ගිනුම් සම්මතයන් හා ඓතිහාසික පිරිවැය පදනම් කර පොදුවේ පිළිගත් ගිණුම් මූල්‍ය ධර්ම අනුව ප්‍රකාශණ පිළයෙල කර ඇති අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බාහිර අංශයන්ගේ ඒකක වල මූල්‍ය ප්‍රතිඵල ඇතුලත් කිරීමෙන් පසු ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත.

2. මණ්ඩලයේ ගිණුම් හා ශේෂ පත්‍රය පිළයෙල කිරීමේදී සාමාන්‍ය සම්ප්‍රදානුකූලව පිළිගත් ගණකාධිකරණ මූල ධර්මයන් අනුගමනය කර ඇති අතර, ගිණුම් කාලයෙන් කාලයට ගිණුම් ප්‍රතිපත්ති සමාන ලෙස යොදාගෙන ඇත. ගිණුම් කාලයට අදාල උපචය වූ ආදායම් හා වියදම් ප්‍රකාශණ වල පෙන්වා ඇත.

3. ස්ථාවර වත්කම් ශේෂ පත්‍රයේ පෙන්වා ඇත්තේ පිරිවැයෙන් ක්ෂය අඩු කල වටිනාකමයි. ස්ථාවර වත්කම් පිරිවැයෙන් ක්ෂය අඩුකර ශේෂ පත්‍රය පෙන්වා ඇතත් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ස්ථාවර වත්කම් නොසලකන ලදී. රු. 23,190,343/- ක් වටිනා ඉඩම් භුක්ති විදින නමුත්, ඒවායේ අයිතිය මෙතෙක් මණ්ඩලය වෙත පැවරී නැත. ඉඩම් වල සම්පූර්ණ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ තබා පෙන්වා නැති නමුත්, කර ඇති ගෙවීම් ස්ථාවර වත්කම් වෙනුවෙන් අත්තිකාරම් රු. 8,299,517/- ක් යනුවෙන් පෙන්වා ඇත.

4. මිලදී ගත් වර්ෂයේ ක්ෂය ගණනය නොකරන අතර, ඉවත් කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහා ගණනය කරනු ලබයි. ක්ෂය ගණනය කිරීම පහත අනුපාත අනුව සරල මාර්ග ක්‍රමයට සිදුකරනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| බස්රථ හා වෙනත් වාහන | 12.5% |
| පිරියත හා උපකරණ | 10% |
| ලී බඩු හා සවිකිරීම් | 10% |
| පරිගණක | 25% |
| බස් එන්ජින් | 20% |

5. සේවකයින් විශ්‍රාම යාමේදී ගෙවීම් සඳහා සේවය කල සෑම වර්ෂයකටම මසක වේතන ප්‍රතිපාදනය කරනු ලැබේ. මෙය සෑහෙන හා සාධාරණ ප්‍රතිපාදනයකි.

6. බොල් ණය වෙන්කිරීම් සඳහා ගණනය කිරීම් විවිධ යුධ හමුදාවේ විශේෂ චාරිකා හා පොලිස් වව්චර් යනාදියෙන් අනුපාතය 5% වේ.

7. තොග අගය කිරීම් ගණනය කොට ඇත්තේ පෙර ලැබීම් පෙර නිකුත් කිරීමේ ක්‍රමය අනුවය.

8. ශ්‍රී ලංකා ගිණුම් සම්මතය 24 අනුව බස් මිලදී ගැනීම සඳහා රජයෙන් දෙනු ලබන ප්‍රදානය ආදායම් වශයෙන් පිළිගෙන ඇත. අවුරුදු 08 ඵලදායී කාලයෙන් පසුව පෙතෙන් ලියා හැරීමට

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல / My No: ආර්ටී/ බී / එස්එල්ටීබී / එෆ්ඒ / 2010

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2014 මැයි 28 දින

සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ ගිණුම, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලවකවානුව තුළ විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව වූ වාර්තාවක් 2013 ඔක්තෝබර් 04 දින සභාපතිවරයා වෙත යවා ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික තැපැල / மின்-அஞ்சல் / E-mail: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථානුචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති හට අභිමතානුසාරී බලතල පැවරේ.

මගේ අභිහතර විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අභිහතර විගණන මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 අභිහතර විගණන මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දක්වන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

--------------------------------

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම වන ශුද්ධ වත්කම් විශාල ලෙස ඍණයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු.මිලියන 12,278.11 ක ඍණ අගයක් ගෙන තිබූ අතර, ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයන් ඇතිවී තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර ප්‍රදාන යටතේ මිළට ගත් රු.මිලියන 204.73 ක් වටිනා එන්ජින් කට්ටල වෙනුවෙන් රු.මිලියන 40.95 ක් හා රු.මිලියන 3.99 ක් වටිනා බස්රථ සඳහා රු. මිලියන 0.5 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 41.45 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 ට අනුව විලම්බිත ප්‍රදාන ආදායම ගිණුම්ගත කර නොතිබුණි. මේ නිසා අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිළට ගනනා ලද රු. මිලියන 204.73 ක් වටිනා බස්රථ එන්ජින් කට්ටල 152 ක් මූල්‍ය ප්‍රකාශනවල තවනම පෙන්නුම් කර තිබූ අතර, ඒ සඳහා සියයට 20 බැගින් ක්ෂය කරනු ලබන බවද දක්වා තිබුණි. එහෙත් පෙර වර්ෂවල මිළට ගන්නා ලද එන්ජින් කට්ටලවල වටිනාකම බස්රථ ගිණුමට ඇතුළත් කර තිබූ අතර, ඒ සඳහා සියයට 12.5 ක ක්ෂය ප්‍රතිපාදනයක් කරතිබුණි. මෙම තත්වය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව මණ්ඩලයේ ඉඩම් හා ගොඩනැගිලිවල පිරිවැය තවත් වෙන්ව හඳුනා නොගෙනුමුත් පිරිවැයෙන් සියයට 50 ක් වූ රු.මිලියන 160,94 ක් ගොඩනැගිලිවල පිරිවැය ලෙස උපකල්පනය කරමින් ඉන් සියයට 2.5 ක ප්‍රතිශතයකින් සරල මාර්ග ක්‍රමය පදනම් කරගෙන ක්ෂය ප්‍රතිපාදනයක් කර තිබුණි.

(ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන ප්‍රකාරව, පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ගණනය කිරීම සඳහා පදනම ලෙස දෙසැම්බර් මාසයේ වැටුප වෙනුවට සාමාන්‍ය වැටුප පදනම් කරගෙන තිබීම හේතුවෙන්, රු.මිලියන 3,191.78 ක් වූ පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ගිණුමේ ශේෂය නිවැරදිතාවය තහවුරුකර නොතිබුණි.

(ඇ) බස් සමාගම් 06 කට අදාලව පිළිවෙලින් පොත් අගය රු.මිලියන 217.68ක් හා රු.මිලියන 369.03 ක් වූ වත්කම් හා බැරකම් ප්‍රත්‍යාගණනයකින් තොරව 2007 වර්ෂයේදී මණ්ඩලය වෙත භාරගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදීද ඒවායේ ප්‍රත්‍යාගණන අගයන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂයේදී ඇණවුම් කරන ලද රු.මිලියන 341.75 ක් වටිනා බස්රථ එන්ජින් කට්ටල 265 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට මණ්ඩලය වෙත ලැබී තිබුණද ඉන් ගිණුම්වලට ගෙන තිබුණේ රු.මිලියන 204.73 ක් පමණි. මේ නිසා රු.මිලියන 137.02 කින් වත්කම් හා රජයේ ප්‍රදාන අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී බස්රථ තුනක් විකුණුම් ලෙස දෙවරක් සටහන් වීම නිසා හා පෙර වර්ෂයේ විකුණන ලද බස්රථ තුනක් සමාලෝචිත වර්ෂයේද විකුණුම් ලෙස සටහන් කිරීම නිසාත් එකතුව රු.මිලියන 1.01 ක අගයකින් බස්රථ විකුණුම් ලාභය වැඩියෙන් දැක්වීම නිසා සමස්ථ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.තවද ගර්භිත බස්රථ ගිණුමේ ශේෂය රු. මිලියන 2.39 කින් හා ගර්භිත බස්රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම රු. මිලියන 2.38 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.315,000 ක් හා සමුච්චිත ක්ෂය රු.314,000 ක්වූ ගර්භිත බස්රථයක් විකිණීමේදී පිරිවැය රු.3,150,000 ලෙසද සමුච්චිත ක්ෂය රු. 3,149,000 ක් ලෙසද සටහන් කිරීම නිසා ගර්භිත බස්රථ ගිණුමේ ශේෂය හා ගර්භිත බස්රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම රු. 2,835,000 ක අගයකින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රවාහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළව භාණ්ඩාගාරය මගින් නිකුත් කරන ලද පරිගණක මුද්‍රිත වාර්තා අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 849.28 ක් මණ්ඩලය වෙත මුදාහැර තිබුණද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ රජයේ ආධාර යටතේ රු.මිලියන 3.99 ක් පමණක් හිණුම්ගත කර තිබුණි. රජයේ ප්‍රදාන යටතේ ලබාගත් රු.මිලියන 341.75 ක් වූ එන්ජින් කට්ටල 265 ක් වටිනාකම ගිණුම්ගත නොවීම වෙනසට බලපා තිබූ අතර ඉතිරි රු.මිලියන 503.54 ක වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් සහතික කර එවා තිබුණු වාර්තාවට අනුව, භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය රු.මිලියන 3,944.89 ක් වූ නමුත්, එය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.මිලියන 319.77 ක් හා සමුච්චිත ක්ෂය රු.මිලියන 319.03 ක් වූ බස්රථ 742 ක් රු.මිලියන 115.55 කට විකුණා තිබූ බව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණි. ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත් තොරතුරු අනුව විකුණුම් වටිනාකම රු.මිලියන 125.59 ක් විය. මෙම වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව තොග ශේෂය රු.මිලියන 1,967.88 ක් වුවද විගණනයට ඉදිරිපත් වූ තොග සමීක්ෂණ වාර්තා අනුව තොග ශේෂය රු.මිලියන 715.74 ක් විය. ඒ අනුව රු.මිලියන 1,252.14 ක් වූ වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

2.2.5 අවිනිශ්චිත ගිණුම්

---

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට ශේෂය වෙනස් වෙමින් ඉදිරියට ගෙන එමින් පැවති අවිනිශ්චිත ගිණුම් 05 ක පැවති බැර ශේෂවල එකතුව රු.මිලියන 400.68ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී ද එම ශේෂ නිරවුල් කර නොතිබුණි.

2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට, රු.මිලියන 1,594.57 ක් වූ වෙනත් ලැබිය යුතු ගිණුම් ශේෂය අතරින්, ප්‍රධාන කාර්යාලයට අදාළ රු.මිලියන 951.77 ක් වටිනා ශේෂ 15 ක් සඳහා වයස්ගත කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණි. ඉන් වර්ෂ 10 කට වඩා පැරණි ශේෂවල ශේෂ 26 ක වටිනාකම රු.මිලියන 210.31 ක් වී තිබුණි. මෙම මුදල් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයට අදාළ රු.මිලියන 2,277.0 ක් වූ ණයගැතියන් තුළ ඇතුළත් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයකට අදාල රු.මිලියන 1,347.81 ක් වූ ශේෂයන් 18 ක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු වසර 25 කට වඩා පැරණි දිගුකාලීන ණය ගිණුම් 05ක ශේෂයන්ගේ එකතුව වූ රු. මිලියන 1,976.66 ක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) 2005 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවැති, රු.මිලියන 5.69 ක් වූ නිකුත් කළ අත්තිකාරම් ගිණුම් ශේෂ නුහාස් සමාලෝචිත වර්ෂයේදවත් වන විටත් පියවා නොතිබුණි.

(ඉ) භාණ්ඩ මිලදී ගැනීම සඳහා නිකුත් කර තිබුණු අත්තිකාරම, භාණ්ඩ මිලදී ගත් වහාම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර තිබුණු රු.105,000 ක අත්තිකාරම් පියවා නොතිබුණි.

(ඊ) 2007 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති ප්‍රධාන කාර්යාලයේ විශේෂ අත්තිකාරම් ගිණුමේ වූ රු.331,650 ක බැර ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

(උ) 2010 දෙසැම්බර් 31 දිනට ඉන්දු ශ්‍රී ලංකා ණය ගිණුමේ ශේෂය රු.මිලියන 38.01 ක් වූ අතර, ඊ වෙනුවෙන් එදිනට ගෙවිය යුතු ණය පොලිය රු.මිලියන 1,176.07 ක් විය. මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2005 සැප්තැම්බර් 18 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීමේදී පවරා ගෙන තිබුණු එකතුව රු.මිලියන 1,174.22 ක් වූ දිගු කාලීන වගකීම් ශේෂ 16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(එ) පසුව මුදල් අයකර ගැනීමේ පදනම මත බාහිර ආයතන 12 ක් වෙත ගමන් අවසරපත් නිකුත් කර තිබුණු අතර, ආදායම් උපචිත පදනම වෙනුවට මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. එකිනෙක ආයතනවලින් ලැබියයුතු ආදායම් වෙනම හඳුනාගැනීමට හැකිවන පරිදි ණයගැති ලෙජර පවත්වා නොතිබුණු හෙයින් සමාලෝචිත වර්ෂය අවසානයට එම ආයතනවලින් ලැබිය යුතු ආදායම නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. එසේ වුවද ඊළඟ වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 111.33 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්වල ගැලපීම් කර තිබුණි.

## 2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූයෙන්, සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂය | වටිනාකම රු.මිලියන | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ජංගම නොවන වත්කම් | 1,842.85 | (i) රු.මිලියන 239.79 ක අගයකින් යුත් ඉඩම් හා ගොඩනැගිලි,මෝටර් වාහන, හරිත වාහන හා අනෙකුත් වත්කම් සම්බන්ධ විස්තරාත්මක උපලේඛන<br>(ii) ස්ථාවර වත්කම් ලේඛනය<br>(iii) 2010 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ වාර්තා |
| (ආ) ආයෝජන | 525.13 | (i) රු.මිලියන 249.39 ක වටිනාකම් ඇති කෙටිකාලීන ආයෝජන, ස්ථාවර තැන්පතු හා අනෙකුත් තැන්පතු වලට අදාළ සහතික පත්<br>(ii) රු.මිලියන 516.41 කට අදාල ආයෝජන ගිණුම් 06 කට අදාල විස්තරාත්මක ලේඛන |
| (ඇ) විවිධ ණයගැතියෝ | 987.23 | (i) ශේෂවල ශේෂ ඇතුළත් ලේඛන<br>(ii) රු.මිලියන 293.65 ක් සඳහා කාල විශ්ලේෂණ |
| (ඈ) ණයහිමියෝ | 2,596.56 | (i) ශේෂවල ශේෂ ලේඛන<br>(ii) රු.මිලියන 2,101.41 ක් සඳහා කාල විශ්ලේෂණ |
| (ඉ) බැංකු ශේෂය | 318.55 | එක් එක් බැංකු ගිණුම් වල ශේෂය දැක්වෙන ලේඛනයක් |
| බැංකු අයිරාව | 854.68 | |

2.2.8 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ (8)(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර ඉදිරි වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළයුතු වුවත්, විගණනයට ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. |
| (ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල් ව්‍යවස්ථා මාලාව හා රෙගුලාසි | සේවකයින්ගේ වැටුපෙන් අයකර ගන්නා අර්ථසාධක අරමුදල් දායකය සහ මණ්ඩලයේ දායකය සේවකයා ඉපයීම කළ මාසයට පසු මාසයේ අවසාන දිනට පෙර අදාළ සේවක අර්ථසාධක අරමුදල් ගිණුම්වලට බැර කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දායක මුදල් හා පෙර වර්ෂවල දායක මුදල්ද ඇතුළත්ව රු.මිලියන 621.36 ක් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන අර්ථසාධක අරමුදලට හා රු.මිලියන 642.13 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල් ගිණුමට බැර කර නොතිබුණි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 4.3 කින් හා සියයට 31 කින් වැඩි වී තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2.25 ක අධිභාරයක් ගෙවා තිබුණි. |
| (ඇ) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | සේවකයාගේ වැටුපෙන් සියයට 03 කට සමාන දායක මුදල් ප්‍රමාණයක් සේවකයා ඉපයීම කළ මාසයට පසු මාසයේ අවසාන දිනට පෙර ආයතනය විසින් අරමුදලට බැර කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දායක මුදල් හා පෙර වර්ෂවල දායක මුදල් ඇතුළත්ව රු. මිලියන 44.9 ක් එසේ බැර කර නොතිබුණි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 16.5 කින් වැඩි වී තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂ තුළදී රු.543,450 ක අධිභාරයක් ගෙවා තිබුණි. |
| (ඈ) 2010 ජූලි 12 දිනැති අංක ශ්‍රී ලංගම/ප්‍රකා/නිසා(කා)2010/18දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(කාර්මික)ගේ ලිපිය | ප්‍රාදේශීය 12 කට අයත් බස්රථ 1,220 ක් ගර්භිත කිරීමටත්, වෙයිමෙන් ගමනාගමට යවා ඇති බස්රථ 143ක් රථ ඇණියෙන් ඉවත් කිරීමටත් උපදෙස් ලබාදී තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

### 2.2.9 නිරවුල් නොකළ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල යටතේ පැවති, රු.මිලියන 1.23 ක මාර්ගස්ථ ඉන්ධන තොග ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) 1999 වර්ෂයට පෙර සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවති, සෙවිංගස් යන වැඩ ගිණුමේ ශේෂය රු.මිලියන 35.75 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) මුළු අගය රු.මිලියන 1,221.31 ක් වූ වලංගු නොවන වත්කම් හා වැරකම් පිළිබඳව සම්පූර්ණ පරීක්ෂාවක් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම හා අනුමැතිය මත පොත්වලින් කපා හැරීමට 2002 ජූලි 30 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමැතිය දී තිබුණු නමුත් එම වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය රු.මිලියන 7,736.84 ක අලාභයක් ලබා තිබුණු අතර, භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 5,616.46 ක ප්‍රදාන හේතුවෙන් එම අලාභය රු.මිලියන 2,120.39 දක්වා අඩු වී තිබුණි. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.මිලියන 7,976.08 ක අලාභයක් ලබා තිබුණු අතර, භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 6,364.38 ක ප්‍රදාන හේතුවෙන් එම අලාභය රු.මිලියන 1,611.7 දක්වා අඩු වී තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට මෙම වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 508.69 ක පිරිහීමක් පෙන්නුම් කරන අතර, රජයේ ප්‍රදාන සියයට 13.3 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් සියයට 5.4 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 1958 වර්ෂයේ බස් සමාගම් ජනසතු කිරීමේදී අත්පත් කරගෙන තිබූ ඉඩම් වෙනුවෙන් රු.මිලියන 8.29 ක වන්දිකාරම් මුදලක් ගෙවා තිබුණි. එම අවස්ථාවන්හිදී ඉඩම්වල පූර්ණ වටිනාකම් අයිතිකරුවන්ට නොගෙවීම හේතුවෙන් එවායේ අයිතිය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පවරා ගැනීමට නොහැකිවී තිබුණි. එම ඉඩම්වල පිහිටීම හා අයිතිය තහවුරු කර ගෙවා තිබුණු වන්දිකාරම් නිරවුල්කිරීමටත් එම ඉඩම් මණ්ඩලයේ නමින් ලියාපදිංචි කිරීමටත් කටයුතු කර නොතිබුණි.

4.2 ආර්ථික නොවන ගනුදෙනු

මණ්ඩලය විසින් අයිරා පහසුකම් ලබා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 42.43 ක මුදලක් පොලිය වශයෙන් ගෙවා තිබුණි. මෙය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 57.64 ක වැඩිවීමකි. තවද මූල්‍ය වියදම් තුළ බැංකු ගාස්තු, බැංකු හර බදු හා වෙනත් වියදම් ලෙස එකතුව රු.මිලියන 51.39 ක් ඇතුළත්ව තිබුණු අතර, චෙක්පත් අවලංගු වීම, ණයපත් අගරුවීම හා ගිණුමේ මුදල් නොමැතිවීම මෙයට හේතුවී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවත්, 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ වර්ෂ 01 කුත් මාස 11 ක් ප්‍රමාද වී 2013 ජනවාරි 12 දින දීය.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා සත්‍ය සංඛ්‍යා සංසන්දනය කිරීමේදී සියයට 07 සිට සියයට 19 දක්වා වූ පරාසයක් තුළ විචලනයන් දිස්වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් භාවිතා කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින්වර වාර්තා කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) තොග පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ණයගැතියෝ හා ණයහිමියෝ
(ඉ) ගිණුම් ශේෂ තහවුරු කිරීම/නිරවුල් කිරීම
(ඊ) වත්කම් හා වගකීම් පවරා ගැනීම
(උ) අයවැය පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.